**ඇල්ල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 08 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **මතය**
------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ඇල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුල ඉඩම් හා ගොඩනැගිලි ලෙස නව සහා ගොඩනැගිලි වටිනාකම රු.1,777,665 ක් වැඩියෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පරිගණක 05 ක් මිලදී ගැනීම ගිණුම්ගත කිරීමේදී වටිනාකම රු.74,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ වටිනාකම රු.33,600 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුල බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවෙන් පවරාගෙන තිබූ රු.217,474 ක් වටිනා ගැල්වනයිස් කොඩි කණු ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂවල ගිණුම්ගතකර තිබූ රු.4,270,000 ක් වටිනා මෝටර් රථ හා කරත්ත 03 ක් නැවත සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුල මධ්‍යම රජයෙන් පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ මෝටර් රථ 03 ක වටිනාකම වූ රු.9,761,032 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් මිලදී ගෙන තිබූ රු.67,500 ක් වටිනා කසල කරත්ත 03 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදල් ණය වටිනාකම රු.5,090,374 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) ඉකුත් වර්ෂයේ නොපියවූ අත්තිකාරම් ලෙස අඩුවෙන් ගිණුම්ගත වූ මුදල සමාලෝචිත වර්ෂයේ සටහන් මගින් ගැලපීම හේතුවෙන් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල හා අත්තිකාරම් ගිණුම් ශේෂය රු.575,266 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂයේ ලද උසාවි දඩ වටිනාකම රු.620,084 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගලපා නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ මුදලින් ලැබුණු උසාවි දණ්ඩන වටිනාකම රු.554,353 ක් නැවත සමාලෝචිත වර්ෂයේ හිඟ හිටි වෙනත් ආදායම් ගිණුමට හර කර උසාවි දඩ ගිණුමට බැර කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ සභාවේ සේවයේ නියුතු නිලධාරීන් 15 දෙනෙකු වෙනුවෙන් ඇප තබා තිබූ රු.91,273 ක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයට අදාල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුළු දායකය වූ රු.32,805 ක් ගිණුම්ගත නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල ඌනතාවය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබූ රු.1,085,177 ක් ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත නොවීමෙන් මූල්‍ය ප්‍රකාශන තුල ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

---------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 51,091,045 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාල ශේෂයන් සහ ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර දක්නට තිබූ වෙනස්කම්වල එකතුව රු.16,895,948 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 26,569,145 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.34,892,397 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු. 55,911,431 ක් වටිනා ගිණුම් විෂයයන් 04 ක්, විස්තරාත්මක උපලේඛන සහ සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 47(2) (1), (3) (1) වගන්ති සහ 49 වගන්ති | ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධව යෝග්‍යතා සහතික ලබානොගෙන සහා බල ප්‍රදේශයේ සිදුකර තිබූ අනවසර ඉදිකිරීම් 75 ක් සම්බන්ධව සභාව විසින් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 අංක 56 සහ 2000 අංක 53 පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 ක් වූ ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය | 2015 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර දරන ලබාගත යුතු ආයතන හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඇ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 217 | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සහ සභාව විසින් පදිංචියට ගන්නා ලද සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පී.එස්.46 ආකෘතිය ප්‍රකාර ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) රීති 218 | පරීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඈ) 2009 සැප්තැම්බර් 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ PF/437 | සභාව සතු වාහන 04 ක් සඳහා රු.170,998 ක වටිනාකමට මෝටර් රථ සඳහා රක්ෂණාවරණ රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් ලබාගෙන තිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංකය JAT2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක 10 ක් පිළිබඳ වත්කම් ලේඛන නඩත්තු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,106,105 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු4,709,589 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට ඉකුත් වර්ෂයන්ට අදාලව ප්‍රාදේශීය සභා අරමුදලට ලැබිය යුතු හිඟ හිටි ආදායම රු.2,641,975 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා බිල්කල ආදායමෙන් රු.3,701,191ක් එනම් 40 % ක් එදිනට හිඟව පැවතුණි.

#### 2.2.2 කඩ කුලී

----------

(අ) සභාව සතු කඩ කාමර 09 ක බදුකරුවන් රු.405,006 ක් බදු කුලී ගෙවීම පැහැර හැර තිබූ අතර, හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ කඩ කාමර වෙනුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් නව තක්සේරුවක් ලබාදී තිබුණද, පැරණි තක්සේරු වටිනාකම අයකරමින් තිබුණි.

#### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.773,349 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,575,916 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සභාව සතු දෙමෝදර ගල්වල 2004 වර්ෂය සඳහා බදුගත් බදුකරුගෙන් අයවිය යුතු රු.348,810 ක හිඟ බදු කුලී, 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු බැකෝ ලෝඩරයේ විධිමත් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර, යන්ත්‍රය සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර පැය 518.6 ක් සභාවේ වගකිව යුතු කාර්මික නිලධාරියෙකුගේ අධීක්ෂණයකින් හෝ වැඩබිම් ඇස්තමේන්තු පිළියෙල කිරීමකින් තොරව සේවයේ යොදවා තිබුණි.

(ආ) 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8ඡ(1) අනුව අනවසර ඉදිකිරීම් සඳහා සභාව දණ්ඩන අයකළ යුතු වුවත්, අනවසර ඉදිකිරීමක් වූ සංචාරක හෝටලයකින් රු.1,426,920 ක දඩයක් අයකර ගෙන නොතිබුණි. සංචාරක හෝටලයේ අයිතිකරුට එරෙහිව නීතිමය පියවර ගනු ලබන බව 2016 ජුනි 10 දින සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ඇ) සභාවේ ජංගම ගිණුමක 2015 වර්ෂයේ සෑම මාසයක් අවසානයේ දීම ලක්ෂ 30 කට වැඩි ශේෂයක් පැවතියද, අතිරික්ත මුදල් සුදුසු ආයෝජන මාර්ගයක යෙදවීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පාලනය

සභාව සඳහා යෝජිතව තිබූ නව සභා ගොඩනැගිල්ල, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් නිකුත් කර තිබූ යෝග්‍යතා සහතිකයේ කොන්දේසිවලට අනුකූල නොවී සභා තීරණයකට අනුව තෝරාගත් කඳු බෑවුම් සහිත භූමියක සෘජු ඉදිකිරීම් ක්‍රමය යටතේ අඩක් ඉදිකිරීම් සිදුකර තිබුණි. 2014 දෙසැම්බර් මාසයේ භූමියට ඉහළ බෑවුමේ නායයෑමක් සිදුවීමෙන් එහි පස්කඳු සහ සුන්බුන් නව ගොඩනැගිල්ලේ පිටුපස හා ඒ අවට ප්‍රදේශයේ එකතු වීමෙන් ඉදිකරමින් පැවති ගොඩනැගිල්ලට හානි වී ඇති අතර, ඒ සඳහා දරණ ලද රු.2,222,335 ක මුදලක් අනර්ථකාරී වියදමක් වී තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 4.1 අයවැය පාලනය

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ආදායම් හා වියදම් පාලනයේ දී ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර භාවිතා කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) වාහන පාලනය